Prepared by – K.S.Karunarathne
R/Sumana Balika Vidyalaya

නිපුණතාව 06 ඃ ශ්‍රී ලාංකේය නර්තන කලාව හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුම රැක ගැනීම සඳහා ක්‍රියාකරයි..

නිපුණතා මට්ටම 6.1 ඃ දේශීය නර්තන කලාවේ විකාශය පිළිබඳ ඓතිහාසික තොරතුරු යුග ඇසුරෙන් විමසුමට ලක් කරයි.

ක්‍රියාකාරකම 6.1 ඃ ගම්පළ යුගයේ සිට අද්‍යයතනය තෙක් නර්තනයේ ඓතිහාසික තොරතුරු විමසමු.

- **<u>නිවැරදි පිළිතුරු තෝරන්න.</u>**

1. ''විහාර දේවාලවල තේවාව සඳහා නියම වූ කුලවලින් පැමිණි කළගෙඩි සෙල්ලමේ යෙදෙන නළඟනෝ වෙති''. රොබට් නොක්ස්ගේ මෙම දේශාටන වාර්තාව ඇතුළත් කෘතිය ,

   (i). විදේශයින් දුටු පුරාණ ලංකාව (ii). කඳවුරු සිරිත (iii). එදා හෙළ දිව (iv). කුවේණි අස්න

2. මහනුවර යුගයේ නර්තන කලාවට මහත් වූ සේවයක් කළ සිංහලයේ අවසාන රජු .

   (i). නිශ්ශංක මල්ල රජු (ii). මහා පරාක්‍රමබාහු රජු

   (iii). ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු (iv). කීර්ති ශ්‍රී රාජසිංහ රජු

3. රජුගේ ගුණ වර්ණනා කෙරෙන කාව්‍ය රචනා කිහිපයකි..

   (i). ශ්‍රී නාමය, පවන, රාජසිංහ විරුදාවලිය, (ii). දඹදෙනි අස්න, දළදා සිරිත, කඳවුරු සිරිත

   (iii). පරංගි හටන, ලංදේසි හටන, ඉංග්‍රීසි හටන (iv). ථූපවංශය, ගුත්තිල කාව්‍ය, මහාවංශය

4. මහනුවර දළදා පෙරහැරට වෙස්නැටුම එකතු කරනු ලැබුවේ,

   (i). නුගවෙල දිසාව (ii). දෙල්ගොඩ දිසාව (iii). මඩුවන්වෙල දිසාව (iv). රත්වත්තේ දිසාව ය.

5. 1934.මැයි 13 දින ශ්‍රී ලංකාවට පැමිණි විදේශ සංචාරකයා කවුද? ,

   (i). ජෝන් ඩේවි (ii). රවීන්ද්‍රනාත් තාගෝර්තුමා (iii). රොබට් නොක්ස් (iv). ස්පිල් බර්ජන්

- **<u>හිස්තැන් සඳහා නිවැරදි පිළිතුරු යොදන්න .</u>**

6. ''මහනුවර පෙරහැරේ රූමත් තරුණියෝ ලස්සනට නටත්........'' මෙම විදේශීය සංචාරක වාර්තාව.......................... විසින් ලියන ලද ................................නම් කෘතියෙහි ඇතුළත් වේ.

7. ශ්‍රී ලංකාවේ ප්‍රථම වෙස් බැඳි කාන්තාව.................................................................. වන අතර ඇයගේ බෙර වාදන ශිල්පියා .......................................................................................................මහතා ය.

8. 1936 දී ..................................................................මහතාගේ ප්‍රධානත්වයෙන් ..............................................සභාව පිහිටු වීය.

9. ......................................... වසරේ දී ගුරුවරුන් පුහුණු කිරීම සඳහා ................................ආරම්භ කරන ලදී.

10. 1972 දී ..................................................................සඳහා නර්තන විෂය අනිවාර්යය වූ අතර 1978 දී .................................... සඳහා විෂය ධාරාවට සෞන්දර්යය විෂය ඇතුළත් කර ඇත.

- **<u>සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.</u>**

11. මහනුවර යුගයේ නර්තන කලාවට රාජ්‍ය අනුග්‍රහය කෙසේ ලැබුණේ දැයි උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න.
12. ක්‍රි.ව.1970න් පසු නර්තන කලාව ප්‍රවර්ධනයට රාජ්‍ය ආයතන මගින් සිදු වූ සේවාව පිළිබඳ ඇගයීමක් කරන්න.
13. ක්‍රි.ව.1930 - 1960 දක්වා දේශීය නර්තනයේ ප්‍රවර්ධනයට බලපෑ සාධක 4ක් දක්වන්න.
14. කෝට්ටේ යුගයේ දී දේශීය නර්තන කලාවට භාරතීය ආභාසය ලැබී ඇති බව සාධක දෙකක් ඇසුරෙන් විග්‍රහ කරන්න.